
# බලවතුන් මැද මහ බලවතෙක්

## ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි



ශ්‍රී නරේන්ද්‍ර මෝදි සාමාන්‍ය පවුලක තෙවන දරුවා ලෙසට 1950 සැප්තැම්බර් 17 වැනදා ගුජරාටයේ වේද්නගර්හි උපත ලැබුවේය. කුඩා කල සිටම උද්යෝගිමත් දරුවකු වූ හෙතෙම කියවීමට මෙන්ම පිහිනීමට ඉතා දක්ෂ සිසුවෙකු විය. පවුලේ ආර්ථිකයට ශක්තියක් වෙමින් සිය පවුලේ ව්‍යාපාරය වූ තේ කඩයෙහි කටයුතු සඳහා උපකාරී වූ ක්‍රියාශීලී දරුවෙකු වූ හෙතෙම කුඩා කල සිටම දුප්පතුන් සවිබල ගැන්වීම (අන්ත්‍යෝදය) යන්න තම ජීවිතය තුළ මූලික කරගත්තෙකු විය. මෝදිගේ පූර්ව ළමාවිය සකස්වීම කෙරෙහි සිය ළමා කාලය ගත කළ වේද්නගර් ග්‍රාමය මහත් බලපෑමක් ඇති කළේය. එය අතීතයෙත් වර්තමානයෙත් බෞද්ධ සංස්කෘතිය තුළ කේන්ද්‍රස්ථානයක් බවට පත්ව තිබෙන අතර එහිදී ලැබුණු බහු සංස්කෘතික සමාජීය අත්දැකීම් ඔහුට තම ජීවිතයේ ඉදිරි දැක්ම සකසා ගැනීම කෙරෙහි මහත් පිටුබලයක් විය. ජීවිතය තුළ ලොකු කුඩා සියල්ලන්ම සමාන ලෙසට සැලකීමේ ගුණය ඔහු කුඩා කල සිටම ප්‍රගුණ කළ විශේෂ ලක්ෂණයක් වූ අතර අයුක්තිය, අසමානාත්මතාව යන්න පිටු දැකුවෙකු විය.


1970 දශකයේ අවසාන කාලය තුළ ඉන්දියාවේ ඇතිවුණු ප්‍රජාතන්ත්‍ර විරෝධී සිදුවීම්වලට සක්‍රියව විරුද්ධ වීමට තරුණ මොදි කටයුතු කළේය. එය මොදි ප්‍රජාතන්ත්‍රවාදය තම දේශපාලන දර්ශනය තුළ මුදුන් මුල්කඩ ලෙස සැලකමීට පටන් ගැනීමේ ආරම්භය ලෙසට සැලකිය හැකිවේ. 1987 වසරේ සිට මෝදි තම දේශපාලන දර්ශනය භාරතීය ජනතා පක්ෂය (BJP) හා සම්බන්ධිතව ඉදිරියට ගෙන ගියේය. ඒ අනුව ගුජරාටයේ භාරතීය ජනතා පක්ෂ මහ ලේකම් ධුරයද, පසුව ගුජරාට මහ ඇමතිධුරය දරමින් ඉන්දියාවේ දිළිඳුතම ප්‍රාන්තයේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කැපවීම මෝදිගේ දේශපාලන අනාගතය වඩාත් ශක්තිමත් කිරීමට උපකාරී විය.

2014 ඉන්දීය මහ මැතිවරණයේදී මෝදි භාරතීය ජනතා පක්ෂයෙන් ඉදිරිපත්විය. සිය ගුජරාට පාලනය තුළ ගුජරාටයේ සංවර්ධනය සඳහා දැක් වූ දායකත්වය මෝදිට දීර්ඝ කාලයක් ගුජරාට මහ ඇමැති ධුරය දැරූ පුද්ගලයා බවට පත්වීමට ඉඩ ලබාදුනි. සිය ගුජරාට පාලනය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ඇගයීම මෝදිට ප්‍රාන්ත නායකත්වය සිට ජාතික නායකත්වයට පැමිණීමට මෙන්ම සමස්ත ඉන්දියානුවන්ගේම සහාය හිමිවීමට ප්‍රධාන ලෙසම බලපාන ලදී. එමෙන්ම මෝදි ඉන්දියානු පාර්ලිමේන්තුවට පළමුවරට පිවිසිමේදී පාර්ලිමේන්තුවට ආචාර කර පිවිසීම දිල්ලියෙන් පිටත කෙනෙකු ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කිරීම නිරූපණය කිරීමක් වේ.

පශ්චාත් සීතල යුද්ධයෙන් පසුව කලාපීය බලවතුන් මෙන් ගෝලීය බලවතුන් තම ජාත්‍යන්තර අභිලාෂයන් සපුරා ගැනීම සඳහා මෘදු බලය යොදා ගනිමින් හරහා ජාත්‍යන්තර සබඳතාවයන් තුළ දෘඪ බලය වෙනුවට මෘදු බලය යෙදවීම කාලීනව ධුරකතනයේ අංගයක් බවට පත්වීම දැකිය හැකිවේ. ඒ අනුව ජාත්‍යන්තරයේ බලපාන සඳහා මෘදු බලය යොදා ගනිමින් බලපෑම් කිරීමට යොමුවීමේ නමනතාවක් ඇතිවීම දැකිය හැකිවේ. තවද ලබාගත හැකි ප්‍රතිඵල වඩාත් ඵලදායී මෙන්ම පාර්ශව වෙතට අවම බලපෑමකින් රටවල් බලය වෙනුවට මෘදු බලය ආදේශ කිරීම සඳහා රටවල් යොමුවීමත් බලපාන ලදී. මේ අනුව Giulio M. Gallarotti ට අනුව මෘදු බලය යනු ඕනෑම ඉලක්කගත රාජ්‍යය ජාත්‍යන්තර වර්යාව වෙනත් රාජ්‍යයක අභිලාෂය අනුව ස්වේච්ඡාවෙන් වෙනස් කිරීමට කටයුතු කිරීම ලෙසට දැකිය හැකිවේ. මෘදු බලය ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර හා අභ්‍යන්තර සාධක මත මූලික වේ. එහිලා ජාත්‍යන්තර නීතිය, ධර්මතා හා ආයතන වෙතට වූ කැපවීම මෙන්ම ජාත්‍යන්තර හිමිකම් හා ප්‍රතිලාභ වෙනුවෙන් වූ බැඳීම ජාත්‍යන්තර සාධක ලෙසටත්, සංස්කෘතික හා දේශපාලන ආයතනවල නිදහස, සමානාත්මතාව, ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ අභ්‍යන්තර සාධක ලෙසට සැලකිය හැකිවේ. ඒ අනුව බලගතවූ ඉන්දියාවේ මෘදු බලය වසාන්ත කිරීම හරහා මෘදු බලය යෙදවීම වඩාත් යෝග්‍යවන අතර ඒ හරහා ජාත්‍යන්තර මෙන්ම ජාත්‍යන්තරව ලබන ප්‍රතිලාභ අතිමහත් වේ.

ඉන්දියාවේ භූගෝලීය පිහිටීම පිළිබඳව විමසා බලන විට ශ්‍රී ලංකාව හා මාලදිවයින හැර දකුණු ආසියානු කලාපයේ සෙසු රටවල් සමග ගොඩබිම් දේශසීමාවලින් සම්බන්ධිතව පවතී. ශ්‍රී ලංකාව හා මාලදිවයින සමඟ සාගර දේශසීමා හරහා සම්බන්ධවේ. ඒ හරහා පිරෙන්නේ ලෙසම කලාපයේ අනෙකුත් රටවල් ප්‍රවාහනා ඉන්දියානු දේශපාලනයට මෙන්ම ඉන්දියාවේ දේශපාලන ප්‍රවණතා කලාපයට ද බලපෑමක් ඇතිවීම ඉතා ඉහළයි. මේ අනුව කලාපය මුල් කරමින් විදේශ ප්‍රතිපත්තියක් කලාපීය බලවතෙකු ලෙසට ගෝලීය තලයට පෙර වීමෙන් ඉන්දියාවේ ජාතික අභිලාෂයන් වඩාත් සුරක්ෂිත කරනු ලැබේ.

ඉන්දියානු විශේෂ අවස්ථාවක් සඳහා ලද ප්‍රධාන ආරාධනාවක් විය. මීට අමතරව සිය සම්ප්‍රදායික ගෝලීය ප්‍රතිවාදියා වූ චීනයේ විරෝධතාව නොසලකා ටිබෙටයේ ප්‍රන්තිවාසි ආණ්ඩුවට ආරාධනා කිරීමෙන් සිය ආරම්භය දකුණු ආසියානු කලාපය තුළ නව ප්‍රවණතාවලින් යුතු වූ




ජනාධිපති ඔබාමා හමුව මොහොතක්

**කොළඹ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා අධ්‍යයන අංශ ප්‍රධාන**
**මහාචාර්ය නයනි මැලගොඩ**

අගනුවරකට කෙරෙහි යොමුවන්නක් බවට මෝදි පැදකුණු කළේය. මේ අනුව පැහැදිලි ලෙසම මෝදි තම කලාපීය ප්‍රමුඛ විදේශ ප්‍රතිපත්තිය ආරම්භයේ සිටම සාර්ක් කලාපයේ රටවල් ඉලක්ක කර ගත්තක් විය. දකුණු ආසියානු රටවලට අමතරව මුරසි රාජ්‍යට ආරාධනා කිරීම හරහා තම කලාපීය ප්‍රතිපත්තිය ඉන්දියන් සාගරය පුරා විහිදුනු වඩාත් පුළුල් ප්‍රතිපත්තියක් බවට ඉඟි පළ කරනු ලැබීය.

මෝදි සිය පළමු විදේශ සංචාරය ලෙසට 2014 ජූනි 16-17 දෙදින නිල සංචාරයක් සඳහා භූතානයට ගිය අතර එහිදී දෙරට අතර නව බලශක්ති හා ආර්ථික සබඳතා වර්ධනය කර ගැනීම පිළිබඳව සාකච්ඡා කරනු ලැබිණ. තවත් අතකින් මෙම සංචාරය ඉතා වැදගත් වන්නේ ඒ හරහා මෝදි තම විදේශ ප්‍රතිපත්තිය හරහා කලාපීය සහයෝගීතාව මෙන්ම ඉන්දියානු ආර්ථික හා බලශක්ති අවශ්‍යතා සපුරා ගැනීම පිළිබඳව වූ දීර්ඝකාලීන අභිලාෂයන් පෙන්නුම් කළ හෙයිනි.

2014 අගෝස්තු 3-4 දෙදින නේපාල නිල සංචාරය ඉන්දීය අගමැතිවරයෙකු වසර 17 කට පසුව නේපාලයට කළ පළමු සංචාරය විය. ඒ හරහා දෙරට අතර නව ආර්ථික අවස්ථා මෙන්ම නේපාලය තුළ



පාකිස්තාන අගමැති හමුව

ඉන්දීය ආර්ථික අභිලාෂයන් සුරක්ෂිත කරගනු ලැබිණ. සැබැවින්ම මෙය මෝදිගේ විදේශ ප්‍රතිපත්තියේ මෘදු බලය තුළ අභ්‍යන්තර සාධක වඩාත් ඉස්මතු කළ අවස්ථාවක් ලෙසට සැලකිය හැකිවේ 2014 නොවැම්බර් මස 25-27 තෙදින නේපාලයේ පැවති 18 වන සාර්ක් සමුළුව සඳහා සහභාගිවෙමින් සාර්ක් රාජ්‍යවල ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස, සමානාත්මතාව හා ජාත්‍යන්තර නීතිය සඳහා වූ කලාපීය කැපවීම් පිළිබඳව අවධානය යොමු කරනු ලැබීය. මීට අමතරව සාර්ක් කලාපීය රාජ්‍ය නායකයින් සමඟ ද්විපාර්ශවීය සාකච්ඡා පවත්වමින් අන්‍යෝන්‍ය වශයෙන් සබඳතා දැඩි කරගනු ලැබිණ. විශේෂයෙන්ම කලාපීය බලශක්ති හා ඉන්දියානු සාගර ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කිරීමට සමත්වීම මෝදිගේ ප්‍රතිපත්ති තුළ දැකිය හැකිවීය.

පාකිස්තානය සමඟ නව්‍ය සබඳතාවක් ඇතිවීමේ ප්‍රවේශයක් සිය දිවුරුම් දීම සමඟ ඇතිකර ගැනීමට හැකිවීම දෙරට අතර දශක හයක අධික කාලයක් පුරා පවතින දේශසීමා ගැටුම් අවම කිරීම ඉලක්ක වුවද, 2014 අගෝස්තු මස සිට දෙරට අතර ඇතිවෙමින් පවතින අස්ථාවර තත්ත්වය තරමක ව්‍යාකූලත්වයක් ඇතිව තිබේ. කෙසේ නමුත් 2015 පෙබරවාරි මස 15 වන දින ඉන්දියාව හා පාකිස්තානය අතර ලෝක කුසලාන පළමු තරගයට පෙර මෝඩි පාකිස්ථාන අගමැතිවරයා වෙත දුරකතන මාර්ගයෙන් සුබ පැතුම් හුවමාරු කර ගැනීම තුළින් තම විදේශ සබඳතා වැඩි දියුණු කර ගැනීම දැකිය හැකිවේ.

කලාපීය වශයෙන් ඇතිකරන නව ප්‍රජාත්‍රන්තවාදී වෙනස්කම් දෙසද මෝදි පාලනය සතුට පළ කරනු දැකිය හැකිවේ. 2015 ජනවාරි මස ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විදේශ ප්‍රතිපත්තිය තුළ කලාපයට මුල්තැන දෙමින් සිය පළමු විදේශ සංචාරය ලෙස ඉන්දියාව තෝරාගැනීම හරහා පසුගිය සමයේදී මඳක්

පසුගාමී වූ ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා නව මානයකට ගෙනයාමට සමත්විය. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන 2015 පෙබරවාරි මස 15-18 සිව් දින නිල සංචාරයට ගොස් ඉන්දීය න්‍යෂ්ටික බලශක්ති ගිවිසුම ඇතුළු දෙරට අතර නව රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇතිවීම සඳහා වූ පූර්ව පිටු බලයක් විය. දෙරට අතර ද්විපාර්ශ්වික සාකච්ඡාවලදී ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම, නිදහස මෙන්ම නව ආර්ථික හා බලශක්ති අවශ්‍යතාව සඳහා මූලිකත්වය ලබාදීම දැකිය හැකිවිය.

ඒ අතුරින් සංචාරය හා පුනර් බලශක්ති ප්‍රභවයන් සම්බන්ධයෙන් දෙරට අතර වඩා නව්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම පිළිබඳවද සාකච්ඡා කෙරිණි. එමෙන්ම සංචාරක හා ආර්ථික ආයෝජන ඉහළ දැමීම පිළිබඳවද ඉන්දීය අගමැතිවරයා ශ්‍රී ලංකාව වෙත ධනාත්මක ප්‍රතිචාරයක් ලබා දුන්නේය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සැසිය තුළ ශ්‍රී ලංකාවට අවශ්‍ය කරනු ලබන කාල රාමුව ලබාදීම සඳහා නැවතත් ඉන්දු - ලංකා සබඳතා ශක්තිමත් කිරීමට මුල පිරීම දෙරටටම ජාත්‍යන්තර සබඳතා තුළ වැදගත්විය. එසේම ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ සංචාරයට ප්‍රතිචාර වශයෙන් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි ශ්‍රී ලංකාවේ නිල සංචාරයක් සඳහා වසර 28 කට පසු ඉන්දීය අගමැතිවරයෙකු මෙරට පැමිණීම සුවිශේෂී විය. ඒ හරහා ඉන්දීය රාජ්‍ය නායකයා ශ්‍රී ලාංකිකයින් අතර ඇතිවීම විශේෂ සැහැලීමක් ශ්‍රී ලාංකිකයින් අතර ඇතිවීම



චීන ජනපති හමුව

ප්‍රවණතාවයක් දැකිය හැකිවනු ඇත.

එමෙන්ම මෝදි සිය ප්‍රජාතන්ත්‍රවාදය සඳහා කැපවීම මනාව පෙන්නුම් කරමින් මෑතකාලීනව මාලදිවයින් තුළ ඇති වූ අස්ථාවර දේශපාලන තත්ත්වය සමනය කිරීමට මැදිහත්ව කටයුතු කළේය. එමෙන්ම එයට වක්‍රව විරෝධය දැක්වීමක් ලෙසට යෝජිත මෝඩිගේ මාලදිවයින් සංචාරය අවලංගු කිරීම හරහා සාර්ක් රාජ්‍යයන්හි ප්‍රජාතන්ත්‍ර ප්‍රවාහය වෙතට වූ ඉන්දියානු නව නැඹුරුතාව විදහා දක්වන ලදී. මේ අනුව සැබැවින්ම මෝඩි තම විදේශ ප්‍රතිපත්තිය තුළ මෘදු බලය උපයෝගී කර ගනිමින් ඉන්දීය කලාපීය ආධිපත්‍ය හා නැඹුරුතාව පවත්වා ගෙනයාමට කටයුතු කරන ලදී.

කලාපයේ පිටත සබඳතා පවත්වා ගෙනයාම සඳහාද මෝඩි සිය විදේශ ප්‍රතිපත්තිය හා සබඳතා යොද ගත්තේය. විශේෂයෙන්ම තම සමීපතම මෙන්ම ආසියානු ආර්ථික ප්‍රතිවාදියා වූ චීනය සමඟ වඩාත් හොඳ සබඳතාවයක් ආරම්භය තුළදී ටිබෙටය සම්බන්ධිත සිදුවීම හරහා තරමක අර්බුදකාරී මට්ටමකට ළඟාවුවද, ජාත්‍යන්තර ආර්ථික සමුළු තුළදී දෙරට අතර නව ප්‍රවේශයන් ඇතිකර ගැනීමට සමත්වීම කෙටි කලක් තුළ දූතකරණය හරහා ඉන්දියානු නව පාලනය ලැබූ ජයග්‍රහණයක් විය. ජපානය හා බ්‍රසීලය සමඟ ද්විපාර්ශ්වික සබඳතා වර්ධනය කර ගැනීමට කටයුතු කිරීම හරහා ඉන්දියානු ආර්ථික මෙන්ම ජාත්‍යන්තර ස්ථාවරත්වය සුරක්ෂිත කර ගත්තේය.

එමෙන්ම ගෝලීය බලවතා වූ ඇමරිකා එක්සත් ජනපදය සමඟ සමීප සබඳතාවක් මෝදිගේ පාලනය විසින් ඇති කරගනු ලැබූ අතර එය ප්‍රජාතන්ත්‍රවාදය මුල්කරගත් දැක්මක් මත පදනම් විය. මේ අනුව 2014 සැප්තැම්බර් 26-30 යන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේදී සම්ප්‍රදායෙන් ඔබ්බට යමින් ඇමරිකානු ජනාධිපති බරෙක් ඔබාමා මෝදි හමුව දෙරට අතර නව සබඳතා ශක්තිමත් කර ගැනීමට ඉවහල්විය. එසේම සිය ඇමරිකානු සංචාරය තුළදී දෙවරක් ඇමරිකානු ජනාධිපතිවරයා හමු වූ මෝදි ඉන්දියානු 66 වන ජනරජ දිනයේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගිවන ලෙස ඔහුට ආරාධනා කළේය. එය ඇමරිකානු ජනාධිපතිවරයෙකු ඉන්දියානු ජනරජ දිනයට ප්‍රධාන ආරාධිතයා ලෙසට සහභාගි වූ ප්‍රථම අවස්ථාව විය. එසේම එය මෝදි බලයට පත්වීමෙන් පසුව ඇමරිකානු ජනාධිපතිවරයාගේ පළමු ඉන්දීය විදේශ සංචාරය වීම ද වැදගත්විය. මේ අනුව 2015 ජනවාරි 26 වන දින ඉන්දියානු ජනරජ දිනයට ප්‍රධාන අමුත්තා ලෙසට සහභාගි වෙමින් දෙරට අතර නව මානයකින් යුතු සබඳතා ඇතිකර ගැනීම පිළිබඳව ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් දෙක ඉඟි පළ කළහ. ඉන්දියාව තම මෘදු බලය ජාත්‍යන්තර තලය තුළ ප්‍රදර්ශනය කරමින් නව ගෝලීය බලවතෙකු ලෙසට දකුණු ආසියානු අනන්‍යතාවකින් ප්‍රවේශ වීමට දරනු ලැබූ උත්සාහය ඉන්දියාවේ නැගෙනහිර බලා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය හා සමගාමී වේ.



ඕස්ට්‍රේලියානු අගමැති හමුවක්

මෝදි සිය විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමේදී දකුණු ආසියානු කලාපය වැදගත්කොට සලකමින් එහි මුල් අඩිතාලම සිය දිවුරුම්දීමේ උළෙල සඳහා සියලුම දකුණු ආසියානු රටවල රාජ්‍ය නායකයන්ට ආරාධනා කිරීමෙන් පැහැදිලි වේ. හිටපු ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙත වූ ආරාධනය තමිල්නාඩු ප්‍රාන්තය දැක් වූ දැඩි ආකල්පමය විරෝධතාව මධ්‍යයේද සිදු විය. එසේ නිදහසේ සිටම දේශසීමා අර්බුද, න්‍යෂ්ටික තරගය මෙන්ම වෙනත් ද්වි පාර්ශවික ගැටලු පවතින පාකිස්තානු අගමැති නවාෂ් ශෙරිෆ් වෙත කළ ආරාධනය ද ඉන්දියානු අභ්‍යන්තර දේශපාලනය තුළ කැළඹීම් ඇති කළ ද එය සාධනීය ලෙසට කලාපය පුරා සමාන සබඳතාව ඇතිකර ගැනීමේ ප්‍රවණතාව විදහා දක්වන්නක් විය. එමෙන්ම

**සටහන**
**කථිකාචාර්ය හසිත් කන්දුදඩහේවා**